# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/315/2025 (PSC)

පී.එච්.පී.පී.සමරතුංග
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.17.**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් නිලූකා කුමාරි මහත්මිය පෙනී සිටී.

## -<u>නියෝගය</u>-

මෙම අභියාචනය සම්බන්ධයෙන් දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට අවධානය යොමු කරන ලදි. අභියාචක විසින් **2025.11.27** වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ලබා දී ඇති විනය දඬුවම අසාධාරණ හෙයින්, ඔහුට ලිහිල් දඬුවමක් ලබා දෙන ලෙසයි. අභියාචක වෙත ඉදිරිපත් කරන ලද චෝදනා **03**ක් මත විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. එකී චෝදනා, **2023.06.20** දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් අභියාචක වෙත නිකුත් කර ඇති ලිපියේ සඳහන්ව ඇත. එකී චෝදනා මත විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් II වන චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇති අතර, 1 සහ III චෝදනා වලට ඔහුව වරදකරු බවට තීරණය කර ඇත. ඒ ආකාරයට අභියාචක වරදකරු බවට පත් කිරීම හේතුවෙන් අභියාචක වෙත දඬුවම් නියම කරමින්, ඔහුගේ වැටුප් වර්ධක තුනක් විලම්භනය කර ඇත. ඊට අමතරව අභියාචකගේ ස්ථාන මාරු ලබාගැනීමේ අයිතිය, වසර **03**කට අවුරා තබා

උතුරු කොළඹ ශික්ෂණ රෝහලට අනුයුක්ත කොට නැවත සේවයේ පිහිටුවා ඇත. තවද වැඩ තහනමට ලක්ව සිටි කාලයට අදාළ වැටුප අත්හිටුවන ලෙසටද නියම කර ඇත. දෙවන දඬුවම දැනට ක්‍රියාත්මක වී ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් නියෝගයක් කිරීමට අවශ්‍ය වන්නේ නැත.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර, ඔහුව වරදකරු බවට පත්කර ඇති පළමු චෝදනාව පහත දැක්වේ.

I. ***ඔබ මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ සැරහුම් ඒකකයේ හෙද නිලධාරියෙකු වශයෙන් රාජකාරි කරමින් සිටියදී, 2022.07.23 දින එම ඒකකයට කකුලේ තුවාලයකට බෙහෙත් දා ගැනීමට පැමිණි එම්.ලක්ෂිකා පීරිස් නැමැති කාන්තාවගෙන් "මහත්තයත් එක්ක කොහොමද ඉන්නේ? සතියකට සැරයක්ද? දවස ගානේ ද? සතියකට කී පාරක් ද? මහත්තයා ආසාවෙන් එනවද? ඔයාගෙ එක ලෙවකනවද? ඔයා මහත්තයාගේ එක කටට දාගන්නව ද? මහත්තයා තමයි ඔයාට ආශාව ඇති කරල ගන්න ඕන" ලෙස ඇසීම හා දණහිස ගාව ඉඳන් ඇඳුම උස්සගෙන උඩටම අත දාලා ඉකිරි වල කුද්දටි තියනවද බැලීම හා/හෝ යට ඇඳුම් ඇත් කර ලිංගේන්ද්‍රිය තුළට ඇඟිල්ල දමීම හා/හෝ/පියයුරු ඔබ ඔබ බැලීම හා/හෝ ටී ෂර්ට් එකේ කරෙන් ඇතුළට අත දමා කිහිලි දෙක ඇල්ලීම මඟින් විෂමාචාරයක් සිදුකිරීම.***

විධිමත් විනය පරීක්ෂණය සඳහා ඉහත කී චෝදනාවේ සඳහන් එම්.ලක්ෂිකා නැමැති අය සාක්ෂි ලබා දී ඇත. ඇය දින දෙකකදී සාක්ෂි ලබා දී ඇති අතර, අභියාචක විසින් පෙනී සිටි රැකවරණ නිලධාරියා එම තැනැත්තියගෙන් දිගින් දිගටම හරස් ප්‍රශ්න ද අසා ඇත. ඇය මූලික සාක්ෂියේ දී චෝදනාවේ සඳහන් සිද්ධිය පැහැදිලිව සාක්ෂි මඟින් ඉදිරිපත් කර ඇත. ඇය හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින්, අභියාචක එම අවස්ථාවේ කුමන ඇඳුම් ඇඳ සිටියාද යන කරුණ සම්බන්ධයෙන්ද පැහැදිලිව සාක්ෂි දී ඇත. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ, ලක්ෂිකා නැමැති සාක්ෂිකාරිය වෙත අභියාචක විසින් කරන ලදැයි කියනු ලබන සිද්ධිය සම්බන්ධයෙන්, කිසිදු හරස් ප්‍රශ්නයක් අසා නොතිබීමයි. එයින් පෙනී යන්නේ එම සාක්ෂිකාරිය එකී සිද්ධිය පිළිබඳව මූලික සාක්ෂියේ දී ලබා දී

ඇති සාක්ෂිය, අභියාචක විසින් ව්‍යංගයෙන් හෝ පිළිගෙන ඇති බවයි. ලක්ෂිකා නැමැති අය සාක්ෂි දෙමින් පහත ආකාරයට සාක්ෂි දී ඇත.

> "**මෙම ප්‍රශ්නගත සිදුවීම මා හට සිදුවූයේ 2022.07.23 වේ. ඊට අදාළ කරුණු මාගේ පැ.10 හා පැ.18 ප්‍රකාශ වල විස්තරාත්මකව සඳහන් කර ඇත. එහි ප්‍රියන්ත මහතා විසින් මා හට සිදුකළ සහ මාගෙන් විමසීම් කළ කරුණු ඇතුළත් බවත් මා කියා සිටිනවා. මාගේ කකුලේ තුවාලයට බෙහෙත් දැමීමට පැමිණි මට මාගේ ස්ත්‍රී ප්‍රජන පද්ධතියට ඇතුළට අත දමා නොයෙක් ප්‍රශ්න ඇසුවේය. මම මහත්තයා සමඟ කොපමණ කාලයක් එක් වෙනවාද? සතියකට කොපමණ කාලයක් සිටිනවාද? ඒ ප්‍රශ්න වගේ නොයෙකුත් දෑ විමසුවා. ඉන්පසු මගේ තනපියරු පවා අත ගා කිහිලි ප්‍රදේශය පවා අත ගැසුවේය. ඉන්පසු මගේ මහත්තයාගේ ප්‍රජනන පද්ධතිය මම කටට ගන්නවාද? එවැනි ප්‍රශ්න චූදිත නිලධාරි ඇසූ බවත්, අදාළ ස්පර්ශ සිදුකල බවත්, මාගේ පැ.18 හා පැ.10 සඳහන් බව මා කියා සිටිනවා**"

ඉහත කී සාක්ෂි මගින් ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙන්, සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් අසා නැත. එබැවින් මෙම සාක්ෂිය අසත්‍ය සාක්ෂියක් බවට තීරණය කිරීමට හේතුවක් දක්නට නොමැත. ඒ අනුව එම සාක්ෂිය ප්‍රතික්ෂේප කිරීමට ද හැකියාවක් නැත. එම සාක්ෂිය මත පැහැදිලි වන්නේ, ඉදිරිපත් කර තිබූ පළවන චෝදනාවට අභියාචක වරදකරු කර තිබීමේ දෝෂයක් නොමැති බවයි.

මේ අවස්ථාවේ දී අභියාචක වෙනුවෙන් කරුණු දක්වමින් පවසා සිටින්නේ, මිගමුව මුලස්ථාන පොලිස් පරීක්ෂකවරයා විසින් අභියාචක වෙත නිකුත් කර ඇති 2023.06.29 දිනැති ලේඛනයේ 03 ජේදයේ සඳහන් පරිදි; පැමිණිලිකාරිය තුවාල සත්කාර ඒකකයේ තුවාල වලට බෙහෙත් දමමින් සිටි බවත්, එම අයගේ සැමියාද එම ස්ථානයට පැමිණ සිට බෙහෙත් දමා ගැනීමෙන් අනතුරුව, සැමියා සමඟ ඇය පිටවී යනවා දුටු බවටත්, එම සාක්ෂිකරුවන් විසින් ලබා දී ඇති ප්‍රකාශයන් හී සටහන් වී ඇති බවය. ඊට අමතරව වෛද්‍ය පෝරම නිකුත් කර තිබියදීත්, ඇය පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කළ බවටද එහි සඳහන්ව ඇති බවත් ය. ඒ අනුව අභියාචක දන්වා සිටින්නේ, එම කරුණ මත පැමිණිලිකාරියගේ සාක්ෂිය නොසළකා හැරිය යුතු බවයි.

පැමිණිලිකාරිය වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව අනාවරණය කර ගැනීමට නම්, ඇයගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න අසා තිබිය යුතුය. නමුත් එවැනි කිසිදු ප්‍රශ්නයක් විධිමත් විනය පරීක්ෂණයේ දී අභියාචක වෙනුවෙන් අසා නැත. කෙසේ වෙතත් ඉහත 2023.06.29 දිනැති ලේඛනයේ සඳහන් පරිදි, ලක්ෂිකා නැමැති සාක්ෂිකාරිය වෛද්‍ය පරීක්ෂණයට සහභාගී වීම ප්‍රතික්ෂේප කළ පමණින්, ඇය විසින් ලබා දී ඇති සාක්ෂිය නොසලකා හැරිය නොහැක.

අභියාචක තවදුරටත් දන්වා සිටින්නේ, එම සිද්ධිය සම්බන්ධයෙන් එක් අයෙකුගේ සාක්ෂියක් පමණක් ඉදිරිපත් කර ඇති බවයි. සාක්ෂිකරුවන්ගේ සංඛ්‍යාව මත සාක්ෂියක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ නොහැක. සාක්ෂි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුවන්නේ, එකී සාක්ෂියේ ඇති විශ්වසනීයභාවය මතය. ඉහතින් සඳහන් කර ඇති ලක්ෂිකා නැමැති අයගේ සාක්ෂිය විශ්වසනීයත්වයෙන් තොර සාක්ෂියක් බවට තීරණය කළ නොහැක. එබැවින් අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉහත කරුණු ප්‍රතික්ෂේප කරමු.

අභියාචක වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විත්ති වාචකය ප්‍රතික්ෂේප කරමින්, මෙම තීන්දුවේ සඳහන් අනෙකුත් හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-